# වතුකරයේ දමිළ ජනතාවගේ චාරිත්‍රවාරිත්‍ර පිළිබඳ මානවවංශ විද්‍යාත්මක අධ්‍යයනයක්

(නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඊට්න් වත්ත දමිළ ගම්මානය ඇසුරින්)

කේ.පී.එම්.කේ. මධුෂානි චන්ද්‍රපාල

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
madushanichandrapala@gmail.com

ප්‍රමුඛ පදඃ දමිළ ජනතාව, චාරිත්‍රවාරිත්‍ර

## හැඳින්වීම

සිංහල සමාජය හා අවියෝජනීය සබඳතාවක් ඇති ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුරට තේ වතු ආශ්‍රය කොට ජීවත් වන දමිළ ජනතාවට ද ඔවුන්ට ආවේනික වූ සංස්කෘතියක් තිබේ ( දිසානායක, එම්ඃ 2009, 104). සමස්තයක් වශයෙන් ඔවුන්ගේ එම සංස්කෘතිය අධ්‍යයනය කිරීම සුළුපටු කාර්යයක් නොවේ. එක් ප්‍රදේශයක එක් ජන කණ්ඩායමක් අධ්‍යයනය කිරීම පවා මහත් දුෂ්කර කාර්යයකි. ඔවුන්ගේ එම සංස්කෘතියේ එක් පැතිකඩක් අධ්‍යනය කිරීම සඳහා මවිසින් තෝරා ගනු ලැබුයේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් "ඊට්න් වත්ත"නැමති දමිළ ගම්මානයයි.

දෛනික ජීවිතයේ යම් යම් අවස්ථා හා සම්බන්ධව වතුකරයේ දමිළ ජනතාව ඉදිරිපත් කරන චාරිත්‍රවාරිත්‍ර වර්තමානය වන විට සාම්ප්‍රදායික තත්ත්වයේ පවතීද යන ගැටලුව පාදක කර ගනිමින් මෙම පර්යේෂණය සිදු කරන ලදි. මේ පිළිබඳ විමසා බැලීමේදී මෙම ගම්මානය ආශ්‍රිතව ජීවත් වන ජනතාවගේ නිවස හා බැඳි චාරිත්‍රවාරිත්‍ර මෙන් ම ඉන් බැහැරව සමාජයේ විවිධ අවස්ථාවන්හිදී ඔවුන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙත් විමසුමට බඳුන් කළෙමි.

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ වතුකරයේ දමිළ ජනතාව අනුගමනය කරන සිරිත්විරිත් පිළිබඳව මානවවංශ විද්‍යාත්මකව විමසුමට බඳුන් කිරීමයි. මීට අමතරව වතුකරයේ දමිළ ජනතාව ඉදිරිපත් කරන චාරිත්‍රවාරිත්‍ර සිංහල සමාජයේ මෙන් සමානකමක් තිබේද යන්න අධ්‍යනය කිරීමට මෙමඟින් බලාපොරොත්තු වේ.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය සිදු කිරීමේදී පර්යේෂණ ප්‍රදේශය පිළිබඳව යම් අවබෝධයක් ලබා ගැනීම සඳහා මූලික අවධානය යොමු විය. එහිදී ඊට්න් වත්ත ගම්මානයේ පිහිටීම හා ස්වභාවය පිළිබඳවත් භෞතික ලක්ෂණ පිළිබඳවත් නිරීක්ෂණයට ලක් කෙරිණි. පර්යේෂණ ගැටලුවට අනුව යමින් වතුකරයේ ජනතාවගේ චාරිත්‍රවාරිත්‍ර පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදි.

විවිධ පර්යේෂකයින් විවිධ ජනකණ්ඩායම් පිළිබඳව බහුල වශයෙන් අවධානය යොමු කරන නමුත් වතුකරයේ දමිළ ජනයා හා සම්බන්ධව අවධානය යොමු වන්නේ අල්ප වශයෙනි. අනෙක් අතට ක්‍රමයෙන් ඔවුන්ගේ සාම්ප්‍රදායික ලක්ෂණ හීන වෙමින් පවතින බව පෙනේ. එබැවින් මෙම මාතෘකාව විමසුමට ලක් කිරීම අත්‍යවශ්‍යය කරුණකැයි සිතමි.

මධ්‍ය කඳුකරය ආශ්‍රිතව බහුලව දමිළ ජනතාව ජීවත් වුවද මා විසින් පර්යේෂණය සඳහා තෝරා ගනු ලැබූයේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් අප්‍රසිද්ධ ගම්මානයක් වීම විශේෂත්වයකි. ග්‍රාමීය ලක්ෂණ හොඳින් දැකිය හැකි ප්‍රදේශයක් බැවින් සාම්ප්‍රදායික චාරිත්‍රවාරිත්‍ර පිළිබඳව අධ්‍යනය කිරීමට සුදුසු පරිසරයක් ලෙස හැඟුණු හෙයින් මෙම ප්‍රදේශය පර්යේෂණය සඳහා තෝරා ගනු ලැබිණි. මෙම අධ්‍යනය සඳහා තෝරා ගනු ලැබූයේ සමාජයේ බහුලව භාවිත වන චාරිත්‍ර විධි කිහිපයකි.

අධ්‍යනය සඳහා මවිසින් තෝරා ගත් ද්‍රවිඩ ගම්මානයේ භූ භෞතික තත්ත්වය හා පිහිටීම පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගැනීම සඳහා සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යනය කල අතර අන්තර්ජාලය භාවිතා කිරීමෙන් ක්ෂේත්‍රයේ පිහිටීම හඳුනා ගැනීමට පහසු විය. මෙම පර්යේෂණය සඳහා මා විසින් සහභාගීත්ව නිරීක්ෂණයක් සිදු කරන ලදි. ක්ෂේත්‍රයට ගොස් තොරතුරු අධ්‍යනය කිරීමේදී ප්‍රදේශය අයත් ග්‍රාම නිලධාරීතුමාගෙන් අසා දැනගත් තොරතුරු සහ අදාළ ගම්මානයේ ගම්වාසීන් සමග සාකච්ඡා කිරීමෙන් ලබාගත් තොරතුරු මෙම ප්‍රදේශය පිළිබඳ අධ්‍යනය කිරීමේදී පිටිවහලක් විය. ඡායාරූප ලබා ගැනීම මඟින් රැස් කරගත් කරුණු මනාව තහවුරු කර ගැනීමට හැකියාව ලැබිණි.

### ප්‍රතිඵල හා සාකච්ඡාව

ඊට්ටන් වත්ත"නැමති දමිළ ගම්මානය අයත් වන්නේ ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයෙහි පිහිටා ඇති නුවරඑළිය දිස්ත්‍රික්කයටයි. නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පූඩළුඔය නගරයට ආසන්නව මෙම ගම්මානය පිහිටා ඇත. මෙම ගම්මානයෙහි ස්වභාවය පිළිබඳව සලකා බැලීමේදී ප්‍රධාන වශයෙන් ම පේළි නිවාස ක්‍රමයක් දක්නට ලැබේ. ඒ හැරුණු කොට තැනින් තැන ඉදි කරන ලද තනි නිවාස දක්නට ලැබේ. මෙලෙස තනිව ඉදි කර ඇත්තේ නව ඉදිකිරීම් බව පැහැදිලිවම හඳුනාගත හැකි ය. පේළි නිවාස ලෙස ඉදි කරන ලද නිවෙස්හි බොහෝමයක බිම ගොම මැටි පිරියම් කර ඇති බව දක්නට ලැබේ. ඒ අතර සිමෙන්ති යොදා සකස් කරන ලද නිවෙස් ද දැකිය හැකි ය. මෙම ප්‍රදේශයේ ප්‍රධාන වැවිල්ල තේ වගාවයි. මීට අමතරව සාර්ථකව එළවළු වගාව සිදු කරනු ලබන අතර එළු, ගව, කුකුළු,වැනි සත්ත්ව පාලනය ගෘහාශ්‍රිතව දක්නට ලැබේ.

ඊට්ටන් වත්ත නම් දමිළ ගම්මානය ආශ්‍රිත ජනතාවගේ චාරිත්‍රවාරිත්‍ර ප්‍රධාන වශයෙන් අංශ කිහිපයක් යටතේ හඳුනාගත හැකි ය. එනම් දෛනික ජීවිතය හා සම්බන්ධ චාරිත්‍රවාරිත්‍ර, ආගමික කටයුතු හා සම්බන්ධ චාරිත්‍රවාරිත්‍ර මෙන් ම විනෝදාශ්වාදය හා සම්බන්ධ අංගන් ය. මා විසින් මෙහිදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලද්දේ මෙම වතුකරය ආශ්‍රිත ජනයාගේ දෛනික ජීවිතය දෙසටයි.

සිංහල සමාජයේ මෙන් වතුකරයේ දරුවන්ගේ කන් විදීම හා සම්බන්ධව සිදු කරන චාරිත්‍රයක් තිබේ. කාදුකුත්තු ශඩංග නමින් හඳුන්වනු ලැබේ. ලංකාවේ සෙසු ප්‍රදේශවල මෙන් ම මෙම දමිළ ගම්මානයෙහි ද ගැහැණු ළමයකුගේ මල්වර වීම සම්බන්ධයෙන් ඉටුකරනු ලබන විශේෂ චාරිත්‍රවාරිත්‍ර කිහිපයක් පවතී. දැරියක වැඩිවිය පැමිණි ප්‍රීතිය වෙනුවෙන් කරන උත්සවය සුප්පයිදල් නමින් හඳුන්වන අතර එහිදී තප්පු වැයීම ශඩංග තප්පු නමින් හඳුන්වනු ලැබේ. විවාහ මංගල අවස්ථාවකදී ද එකී උත්සවයේ චමත්කාරය මුළු වතු යායට ම සන්නිවේදනය කිරීමේ අභිප්‍රායෙන් තප්පු නම් වූ වතුකරයට ම ආවේනික රබන් දෙකක් බඳු වූ අත් බෙර වාදනය කරති. එය කළසාන තප්පු නමින් හඳුන්වති.

යෝජිත විවාහයකදී මංගල්‍යය ස්ථිර කිරීමේ දිනය "නිච්ච තාබලම්" නම් වෙයි. ඇතැමුන් විසින් "මිංජි බැඳීම" නමින් මුදුවක් පැලඳවීමේ චාරිත්‍රයක් ද සිදු කරති. අවමංගල්‍යය අවස්ථාවකදී ද ඔවුන්ට ම ආවේනික වූ චාරිත්‍ර විධි රාශියක් තිබේ. කිසියම් පුද්ගලයෙකුගේ මරණයක් සිදු වුවහොත් ඒ බව දැන්වීමට මළබෙර වයති. එය ශාම්තප්පු නමින් හඳුන්වයි.

වතුකරයේ දමිළ ජනතාවගේ ජීවිතය එකතැන පල්වෙන ඒකාකාරී වූ කටුක දිවියක් බව කනගාටුවෙන් වුවත් සඳහන් කළ යුතුව තිබේ. ඔවුන්ගේ සුබාස්වාදය කෙරෙහි කිසිවෙකුගේ උනන්දුවක් දක්වා කිසියම් වැඩ පිළිවෙලක් ආරම්භ කොට නැත.

මොවුන්ගේ සිරිත්විරිත් සිංහල සමාජය සමඟ බැඳීමක් පවතීද යන්න සලකා බැලීමේදී සිංහල බෞද්ධ සංස්කෘතිය බොහෝ දුරට හින්දු ආගමෙන් ලද ආභාෂය විදහා දක්වන බව සිතිය හැකි ය. බෞද්ධයන් විසින් දේවත්වයෙන් සලකන ගණ දෙවි, විෂ්ණු දෙවි, කතරගම,පත්තිනි, කාලි යන දෙවිවරුන් ප්‍රධාන කොට ම මෙම දමිළ ජනතාවගෙන් වැඳුම් පිදුම් ලබන දේව කොට්ඨාශයන් ය. මෙම ජනයා ඔවුන්ට ආවේනික දීපවාලී, තෛපොංගල් වැනි උත්සව වසරක් පාසා පවත්වන විට බෞද්ධයෝ අලුත් සහල් මංගල්ලය, කාර්තික මංගල්ලය වැනි උත්සව පවත්වති ( දිසානායක, එම්: 2009, 56 ). මෙම උත්සව ඔවුන්ගේ සංස්කෘතියට ආවේනික ලක්ෂණයන් ය. එයින් ඔවුන්ගේ ජාතික අනන්‍යතාව ද පිළිබිඹු වේ.

මෙම ගම්මානය ආශ්‍රිතව ජීවත් වන ජනතාවගේ දෛනික ජීවිතය හා සම්බන්ධ වූ චාරිත්‍රවාරිත්‍ර පිළිබඳව විමසා බැලීමේදී ඔවුන්ගේ සිරිත්විරිත් තවමත් සාම්ප්‍රදායික මට්ටමක පවතින බව පෙනේ. මෙහිදී විශේෂයෙන් ම සඳහන් කළ යුතු කරුණක් තිබේ. මෙම ගම්මානයේ තරුණ පරපුර දියුණු වන සමාජයත් සමඟ ගැටෙමින් සාම්ප්‍රදායිකත්වයෙන් ඔබ්බට යෑමට උත්සාහ කරන බවක් පෙනෙන්නට තිබේ. නමුත් අතීතයේ සිට තම සම්ප්‍රදායන් රැකගෙන ආ වැඩිහිටි පරපුර ඒ සඳහා කිසිඳු කැමැත්තක් නොමැති බව පෙනේ. ඔවුහු තව දුරටත් තමන්ගේ සංස්කෘතිය ආරක්ෂා කර ගැනීමට දැඩි කැමැත්තක් දක්වති. ඔවුන්ගේ ඇඳුම් පැළඳුම් වුවද සාම්ප්‍රදායික මට්ටමේ පවතී. සමස්තයක් වශයෙන් ගත් කළ මෙම ගම්මානයේ ජනතාව අනුගමනය කරන චාරිත්‍රවාරිත්‍ර වර්තමානය වන විටත් සාම්ප්‍රදායික මට්ටමේ පවතින බව නිගමනය කළ හැකි ය.

### ආශ්‍රිත ග්‍රන්ථ


දිසානායක මුදියන්සේ (2009) ***ශ්‍රී ලංකාවේ දමිළ සංස්කෘතිය***; එස් ගොඩගේ සහ සහෝදරයෝ